# 1 අලුත් සහල් මංගල්‍යය

**දහනව වන සියවසේ මුල දී, ජාතික උත්සවයක් ලෙසට අලුත් සහල් මංගල්‍යය ආරම්භ වී ඇත. අලුත් සහල් ගෙන ඒමට ගුරුදෙණියට පිටත් වීම, ගබඩාවල අලුත් සහල්, වී තැන්පත් කිරීම හා අලුත් සහල් දානය පූජා කිරීම යනුවෙන් මේ උත්සවයේ වැදගත් අවස්ථා තුනක් ඇත.**

ඉතා ඈත කාලයක පටන් දළදා මාලිගාවේ සිදු කරනු ලබන විශේෂ පූජාක්‍රම රාශියකි. නානුමුර මංගල්‍යය, අලුත් සහල් මංගල්‍යය, කාර්තික මංගල්‍යය, පෙරහැර මංගල්‍යය ආදිය ඒ අතරින් ප්‍රධාන වේ.

මිනිසා ගොවිතැන ජීවනෝපාය කරගත් තැන් පටන්, ආගමික ප්‍රතිපත්ති හා චාරිත්‍ර වාරිත්‍ර අනුසාරයෙන් ගොවිතැන පිළිබඳ සංස්කෘතික සම්ප්‍රදායයක් බිහි විය. ඒ අනුව බෞද්ධ ගොවියා කුඹුරෙන් හෝ හේනෙන් හෝ ලබාගත් ධාන්‍යවලින් මුල් කොටස, එනම් අග්‍රඵලය, බුදු පුදට හා දෙවි පුදට වෙන් කළේ ය.

ශ්‍රී දළදා මාලිගාවේ නානුමුර මංගල්‍යයට අමතර ව, හැම වසරක ම දුරුතු පෝයට අලුත් සහල් මංගල්‍යය පැවැත් වේ. එයින් අදහස් වන්නේ අලුත් අස්වැන්න ගෙට ගැනීමයි. මේ මංගල්‍යය ක්‍රි.ව. 1707-1739 රජ කළ, නරේන්ද්‍රසිංහ රජු විසින් ආරම්භ කරන ලද බව පැවසේ. මෙය අග්‍රශස්‍ය හා අගසස් දානය ලෙස ද හැඳින්වේ. එසේ ම, අලුත් සහල් මංගල්‍යය අලුසාල් මංගල්‍යය, අලුසල් මංගල්‍යය ලෙස ද නම් කෙරේ.

එකල මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ අලුත් සහල් මංගල්‍යය පිළිබඳ ව, චාරිත්‍ර පැවැත්වුණේ ගුරුදෙණිය කෙතෙහි හා ඒ ආශ්‍රිත අටුවල ගබඩා කළ වී අස්වැන්න ආශ්‍රිත ව ය. මහවැලි යෝජනා ක්‍රමයෙන් එම අටුව පිහිටි භූමිය ද ජලයෙන් යට වූයෙන් ඒ වෙනුවට කුණ්ඩසාලේ, පල්ලෙකැලේ, රජයේ ඉඩමකින් කොටසක් ශ්‍රී දළදා මාලිගාවට පවරා දී ඇත. වර්තමාන අටුව පිහිටා ඇත්තේ මෙහි ය. ශ්‍රී දළදා මාලිගාවට වාර්ෂික ව ලැබිය යුතු සම්බා හා වෙනත් වී සහල් අස්වැන්න තැන්පත් කරනුයේ මේ අටුවේ ය. ගුරුදෙණියේ පිහිටි රාජකීය සහල් ගබඩාව ඒ ආකාරයෙන් ම මේ ඉඩමේ ඉදි කළ අතර, දැන් සහල් බෙදීමේ චාරිත්‍රය සිදු වන්නේ කුණ්ඩසාලේ ගබඩා කර ඇති අස්වැන්න ආශ්‍රිත ව ය.

මේ උත්සවය අවස්ථා තුනකින් සමන්විත ය. පළමු ව දළදා මාලිගාවේ නැකැත් මොහොට්ටාල නැකැත් පත්‍රයක් සූදානම් කරයි. කපුරාල, වන්නකපුරාල, කට්ටියානෙරාල, වියන් අල්ලන්නන්, මුතුකුඩකරු, හොරණෑකරුවන්, දවුල් තම්මැට්ටම් වයන්නන් යනාදීන්ගෙන් සමන්විත පෙරහැර දළදා මාලිගාවට පැමිණෙයි. නැකැත් පත්‍රයේ දක්වා ඇති සුබ නැකතට දළදා මාලිගාවේ දියවඩන නිලමේතුමා, කාරියකරවනරාල, දළදා මාලිගාවේ ලේකම් මහතා, වට්ටෝරුරාල, නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි දේවාලවල කපුරාලවරු යන මොවුහු, ගුරුදෙණියේ පැරණි අස්වැන්න ගබඩා කර ඇති අටුව (වර්තමාන කුණ්ඩසාලේ අටුව) කරා යති.



දෙවනු ව සිටින විදානේවරු පෙරට පැමිණ, ඔවුන් පිළිගෙන, පෙරහැර ගබඩාව කරා කැඳවාගෙන යති. මෙහි දී විදානේ හා ගමරාලලා හත් දෙනෙක් දියවඩන නිලමෙතුමාට බුලත් හුරුලු පිළිගන්වා, සහල් අස්වනු අටුව කරා පැමිණෙන ලෙස ආරාධනා කරති. පාවාඩ මතින් සහල් අටුව කරා (ධාන්‍යාගාරයට) යන දියවඩන නිලමෙතුමා එහි දී තේ පැන්, බුලත් ආදියෙන් සංග්‍රහ ලබයි. මෙහි දී ගමරාලලා හත් දෙනකු අඩුක්කු හැළි හතක් ද, ව්‍යංජන 30ක් ද, මේ ස්ථානයට ගෙන ආ යුතු ය. ශ්‍රී දළදා මාලිගාවෙන් හා සතර දේවාලවලින් පෙරහැරට පැමිණි ජනයාට මේ ආහාරවලින් සංග්‍රහ කෙරෙයි. මේ සංග්‍රහයෙන් අනතුරු ව දියවඩන නිලමෙතුමා සහ මාලිගාවේ සෙසු නිලධාරිහු සහල් තැන්පත් කර ඇති ස්ථානයට යති. මඟුල් බෙර වැයීමෙන් ද, හේවිසි වාදනයෙන් ද ස්තෝත්‍ර ගායනා කිරීමෙන් ද අනතුරු ව සතර දේවාලවල කපුරාලවරු අෂ්ටක කියති. තදනන්තර ව මොහොට්ටාල ලේකම් මිටිය රැගෙන, "දළදා මාලිගාවට සහල් නැළි තිහයි වී නැළි පහළොවයි" යනුවෙන් පවසයි. දියවඩන නිලමෙතුමා සහල් බෙදීමේ සංකේතයක් වශයෙන් රිදී නැළියෙන් චාරිත්‍රානුකූල ව මාලිගාවට වී සහල් බෙදීමෙන් වී සහල් බෙදීමේ මංගල චාරිත්‍රය අරඹයි.

තෙවනු ව, මාලිගාවේ අටුවේ මනින්නා (මනන්නා) ලේකම් විසින් කියවනු ලබන ලේඛනයට අනුව ඒ ඒ ස්ථානයට වී සහල් බෙදා දෙයි. පළමු ව ශ්‍රී දළදා මාලිගාවට ද, ඉන් පසු පිළිවෙළින් විෂ්ණු, කතරගම, පත්තිනි යන දේවාලයවලට ද ඉන් පසු මල්වතු අස්ගිරි විහාරවලට ද වී සහල් මනිනු ලැබේ. නම් පොතේ පිළිවෙළ අනුව ගංගාරාමය, දෙගල්දොරුව, කුණ්ඩසාලේ ආදි දේවාලයවලට ද වී සහල් බෙදනු ලැබේ. මෙසේ බෙදා දුන් අස්වැන්න, හේමකඳක තබා රැගෙන යෑම සිරිතයි.

එක් එක් දේවාලයට ලැබුණු ධාන්‍ය කොටස රැගෙන යන්නේ පෙරහැරෙනි. මාලිගාවේ හා සිවු දේවාලයේ පෙරහැර අස්වනු ගෙනැවිත් ලේවැල්ල අසල ගංගාරාමයේ තබා නවාතැන් ගැනීමේ චාරිත්‍රයක් පැවතිණි. වර්තමානයේ වී සහල් ලේවැල්ලේ තබා, පසු දා පැමිණ, අලි ඇතුන් සහිත පෙරහැරින් අස්වනු දළදා මාලිගාවටත් ඒ ඒ ස්ථානවලටත් ගෙන යති. එසේ ගෙන ගොස් සුබ මොහොතින් අස්වැන්න ගබඩා කෙරේ.

දුරුතු පුර පසළොස්වක් පුන් පොහෝ දින, අලුත් සහලින් සේරු 80ක් ගෙන, ආහාර පිස, දළදා මාලිගාවේ "මහකිරිබොඩ" පාත්‍රයට පුරවා, ව්‍යංජන දෙතිසක් හා අවුළුපත් සමග දළදා වහන්සේට පූජා කෙරේ. තව ද, වී සහල් ලද දේවාලයවල හා විහාරස්ථානවල ද බුද්ධ පූජා පවත්වනු ලැබේ. වී සහල් ලබාගැනීම සඳහා යම් ආයතනයක් නො පැමිණිය හොත්, ඒවා ද දළදා මාලිගාවට අයත් වෙයි.

දළදා වහන්සේගේ හා දෙවිවරුන්ගේ ආශීර්වාදයෙන් නිසි කලට වැස්ස ලැබී, සරු අස්වැන්නක් ලැබෙන බවට විශ්වාසයක් පවතී. එම අස්වැන්නෙහි අග්‍ර කොටස දළදා වහන්සේට පූජා කිරීම, අලුත් සහල් මංගල්‍යයේ අරමුණ ලෙස සඳහන් කළ හැකි ය.

කතරගම කිරිවෙහෙර, පොලොන්නරුව ගල්විහාරය, කළුතර බෝධිය, අනුරාධපුර ශ්‍රී මහා බෝධිය, මහනුවර ශ්‍රී දළදා මාලිගාව ආදි ස්ථාන කීපයක ම මේ අලුත් සහල් මංගල්‍යය පැවැත්වේ.

*දළදා මාලිගාවේ නැකැත් මොහොට්ටාල විසින් සූදානම් කරන ලද නැකැත් පත්‍රයකි.*

**නමෝ බුද්ධාය.**

**ශ්‍රී බුද්ධ වර්ෂ 2518 ශක වර්ෂ 1898 ක්‍රි.ව. 1975 ශ්‍රී සෙංඛණ්ඩ ශෛලාභිධාන මහනුවර ශ්‍රී දංෂ්ට්‍රා ධාතු මන්දිරයේ අලුත් සහල් මංගලෝත්සවය යි.**

ශක වර්ෂ 1898ක් වූ ධනු රවි 11 භාග වූ දුරුතු මස පුර 11 ලත් කිවි දින හෙවත් **ක්‍රි. ව. 1975ක් වූ ජනවාරි මස 24** වෙනි දින **සවස 5.00 පසු වී මිනිත්තු 20**ට දක්ෂිණ දිශාභිමුඛ ව ***ගුරුදෙණියට පිටත් ව යාමට සුබ යි.***

**ක්‍රි ව. 1975ක් වූ ජනවාරි මස 25** වෙනි දින ශනි දින උදය **9.00 පසු වී මිනිත්තු 22**ට දක්ෂිණාභිමුඛ ව ශ්‍රී දළදා මැඳුර ප්‍රධාන කොට ඇති ***සියලු විහාර දේවාලයන්හි ධාන්‍යාගාරවල, වී සහල් තැන්පත් කිරීම සුබ යි.***

**ක්‍රිස්තු වර්ෂ 1975ක් වූ ජනවාරි මස 27 වෙනි සඳු දින දහවල්** 11.00ට උත්තරාභිමුඛ ව ශ්‍රී දළදා මැඳුර ප්‍රධාන කොට ඇති සියලු *විහාර දේවාලයන්හි අලුත් සහලින් පිසින ලද ප්‍රණීත රසයෙන් යුත්* ***මුළුතැන් මංගල්‍යය සිදු කිරීමට සුබ යි.***

තව ද ශ්‍රී දංෂ්ට්‍රා ධාතු මන්දිරය ලැබී කරවන දියවඩන නිලමේතුමන්ගේ අවසරය පරිදි නැකැත් මොහොට්ටාල වන

නැකැත් මොහොට්ටාල
*ශ්‍රී දළදා මාලිගාව,*
*මහනුවර.* *19750101*

## 1.1 අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| අග්‍ර කොටස | - | මුල්කොටස; උතුම් කොටස |
| අඩුක්කු හැළි | - | බුදුන්, දෙවියන් උදෙසා ආහාර පිසින හැළි |
| අවුළුපත් | - | කැවිලි වර්ග |
| තදනන්තර ව | - | ඊට පසු |
| හේමකද | - | රත්තරන් කද (වාච්‍යාර්ථය)- බුද්ධ පූජා, දේව පූජා පිණිස මෙන් ම රාජභෝජන පිණිස ද පිළියෙල කළ ආහාර ගෙන යෑමට භාවිත කළ කද |
| මහකිරිබොඬ පාත්‍රය | - | උඩරට විහාරස්ථානවල ඇති මහා පාත්‍රයක නාමය (හාල් බුසල් කීපයක කිරිබත් අඩංගු කළ හැකි වේ.) |

## 1.2 ක්‍රියාකාරකම 1

i. ශ්‍රී දළදා මාලිගාවේ වාර්ෂික ව සිදු කෙරෙන ප්‍රධාන උත්සව නම් කරන්න.
ii. අලුත් සහල් මංගල්‍යය පවත්වන මාසය කුමක් ද?
iii. අලුත් සහල් මංගල්‍යයේ දී දියවඩන නිලමෙතුමාට පැවරෙන කාර්යයන් මොනවා ද?
iv. නැකැත් මොහොට්ටාල සතු භාරදූර කාර්යය කුමක් ද?
v. දියවඩන නිලමෙතුමා හැර අලුත් සහල් මංගල්‍යයට සහභාගි වන අනික් අයගේ නම් ලැයිස්තුවක් පිළියෙල කර ඒ ඒ තනතුරට අදාළ කාර්යයන් ලියා දක්වන්න.
vi. පාඩමේ දැක්වෙන නැකැත් පත්‍රය ශ්‍රැතිගෝචර රටාවෙන් කියවන්න.
vii. අලුත් සහල් මංගල්‍යය ගැන පන්තිය ඉදිරියේ කථාවක් පවත්වන්න.

## 1.3 ක්‍රියාකාරකම 2

### ශ, ෂ, ස අකුරු භාවිතය

සිංහල භාෂාවේ තාලුජ 'ශ' මූර්ධජ 'ෂ' දන්තජ 'ස' යන අකුරු නිසි තැන යෙදීම අවශ්‍ය වේ. මේ අකුරු අතරින් වැඩි වශයෙන් ගැටලු මතු වන්නේ තාලුජ ශ සහ මූර්ධජ ෂ යෙදීමේ දී ය.

**තාලුජ ශ**

**තද කළු අකුරු කෙරේ අවධානය යොමු කරමින් පහත දැක්වෙන පද කියවන්න.**

i. නිශ්චල, විනිශ්චය, පශ්චිම, තිරශ්චීන
ii. නිශ්ශබ්ද, නිශ්ශංක, දුශ්ශීල, ජ්‍යොතිශ්ශාස්ත්‍රය
iii. විශ්වය, අශ්වයා, විශ්වාසය, ඊශ්වර

මෙහි පළමු වන පෙළෙහි ඇති පද හතරෙහි ම 'ච' යන්නට පෙර තාලුජ 'ශ' යන්න ද දෙවන පෙළෙහි ඇති පද හතරෙහි ම 'ශ' යන්නට පෙර තාලුජ 'ශ' යන්න ද තෙවන පෙළෙහි ඇති පද හතරෙහි ම 'ව'යන්නට පෙර තාලුජ "ශ" යන්න ද යෙදී ඇත. මෙයින් පැහැදිලි වන්නේ 'ච, ශ, ව' යන අකුරුවලට පෙර බෙහෙවින් යොදන්නේ තාලුජ 'ශ' බව ය. එහෙත් ස්වාභාවික, ආස්වාදය, රසාස්වාදය උත්සව ආදි තන්හි දන්තජ 'ස' ද යෙදේ.

**තාලුජ ශ කාරයෙන් ආරම්භ වන වචන කිහිපයක් මෙසේ ය.**

| | | | |
|---|---|---|---|
| ශරීර | ශාස්ත්‍ර | ශිරෝමණී | ශිෂ්‍ය |
| ශල්‍ය | ශිබා | ශිලා | ශීතල |
| ශ්වේත | ශිෂ්ට | ශිල්ප | ශක්ති |
| ශික්ෂණ | ශිථිල | ශෝභන | ශතක |
| ශිබර | ශුද්ධ | ශේෂ | ශබ්ද |
| ශික්ෂා | ශුෂ්ක | ශ්‍රවණ | ශිරා |
| ශෝකය | ශෛලිය | ශ්‍රව්‍ය | |

මූර්ධජ 'ෂ'

**තද කළු අකුරු කෙරේ අවධානය යොමු කරමින් පහත දැක්වෙන පද කියවන්න.**

i. ශිෂ්ට, ඉෂ්ටාර්ථය, න්‍යෂ්ටිය, ගුරුමුෂ්ටිය
ii. ශ්‍රේෂ්ඨ, කනිෂ්ඨ, අධිෂ්ඨානය
iii. දුෂ්කර, විෂ්කම්භය, ශුෂ්ක, නිෂ්ක්‍රිය
iv. නිෂ්පන්න, නිෂ්පාදන, නිෂ්ප්‍රභ, පුෂ්ප
v. කෘෂ්ණ, උෂ්ණ, තෘෂ්ණා

**ඉහත දැක්වූ නිදර්ශනවලට අනුව ට, ඨ, ක, ප, ණ යන අකුරුවලට මුලින් යෙදෙන්නේ මූර්ධජ 'ෂ්' කාරය බව පෙනේ.**

1. පරීක්ෂණ, ප්‍රත්‍යක්ෂ, රක්ෂාව, භික්ෂු ආදි යෙදුම්වලින් පැහැදිලි වන්නේ 'ක්'යන්නට පසු ව මූර්ධජ 'ෂ' යෙදෙන බවයි.
2. ප්‍රශස්ති, ශාස්ත්‍රය, ශාසනය ආදි යෙදුම්වලින් පැහැදිලි වන්නේ 'ශ , ස' යන අකුරු එක ළඟ යෙදෙන විට තාලුජ 'ශ' යන්න මුලින් බෙහෙවින් යෙදෙන බවයි.
3. ශිෂ්ටාචාර, ශුෂ්ක ප්‍රදේශ, ශේෂ, විශේෂ ආදි තැන්වලින් පැහැදිලි වන්නේ 'ශ' 'ෂ' යන අකුරු එක ළඟ යෙදෙන විට තාලුජ ශ යන්න මුලින් යෙදෙන බවයි."

**දන්තජ 'ස' අකුරු කෙරේ අවධානය යොමු කරමින් පහත දැක්වෙන පද කියවන්න.**

සමග, පුස්තකය, වස්තු, විස්මය, ස්මරණ

## 1.4 ක්‍රියාකාරකම 3

**පහත දැක්වෙන වචනවල ශ, ෂ, ස, යෙදී ඇති සැටි වැරදි ය. නිවැරදි කර ලියන්න.**

| | | |
|---|---|---|
| i. දේෂන | v. ප්‍රදර්ෂන | ix. දුස්ශිල |
| ii. තාක්ශණ | vi. අක්ශර | x. නිස්චල |
| iii. රක්සණ | vii. නිශ්පාදන | xi. අස්වයා |
| iv. පෝශණය | viii. ශ්‍රේස්ඨ | xiii. විස්වය |

**පහත සඳහන් පාඨවල වරහන් තුළ ඇති පද අතුරින් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරා ලියන්න.**

i. ශබ්ද (විකාසනය, විකාශනය, විකාෂනය)
ii. (නිශ්ඵල, නිෂ්ඵල, නිස්ඵල) උත්සාහයක්
iii. (ආස්චර්ය, ආශ්චර්ය, ආෂ්චර්ය) ජනක
iv. (නිස්ක්‍රිය, නිෂ්ක්‍රිය, නිශ්ක්‍රිය) විය.
v. ඉන්දු නිම්න (ශිෂ්ටාචාරය, ශිස්ටාචාරය, ශිශ්ටාචාරය)

**1.5 පැවරුම්**

i. අලුත් සහල් මංගල්‍යය පිළිබඳ චාරිත්‍ර විධි අලළා කෙටි ලිපියක් සකස් කරන්න.

ii. මූර්ධජ 'ෂ' යෙදී ඇති වචන ලැයිස්තුවක් පිළියෙල කරන්න.

iii. ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා බැඳුණු වෙනත් වාර්ෂික උත්සව දෙකක් අලළා පාසලේ බිත්ති පුවත්පතකට ලිපි දෙකක් සකස් කරන්න.

**රචනයක් ලියමු.**

"කෙත ආශ්‍රිත උත්සවයක්"

**සංකල්පනා**

| | |
|---|---|
| ලොව්තුරු මුනිඳුගෙ අණය | මුළුල්ලේ |
| සිව්වර දෙවියෝ සහ | මෙසියල්ලේ |
| සව් සත රකිනා උපතකි | ඉල්ලේ |
| සව් සිරි වෙයි අලු සල් | මංගල්ලේ |